# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1506/6 – 2007 ජුලි 18 වැනි බදාදා – 2007.07.18

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ජෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 44 (2) වගන්තිය සමඟ කියවිය යුතු 2007 අංක 15 දරන සංශෝධන පනත මගින් සංශෝධිත 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 12 වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සාදන ලද නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2007 ක් වූ ජුලි මස 18 වැනි දින,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
කොළඹ .

නියෝග

2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වගන්තියට අදාලව සාදන ලද, 2007 ජූනි මස 20 දිනැති අංක 1502/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගයන් පහත පරිදි සංශෝධනය විය යුතු ය.

02.1 ඡේදයේ සඳහන්,

"3 වන නියෝගයෙහි යම් ඡේදයක සඳහන් යම් වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක නිරත යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් 2007 අප්‍රේල් 01 දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් අදාල කාර්තුවක් සඳහා,

(i) එම වෙළෙඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් එම කාර්තුව සඳහා ලබන පිරිවැටුම එම ඡේදයට අනුකූලව නිශ්චය කිරීම,

(ii) ඉහත සඳහන් පනතේ 2 වගන්තියේ (2) උප වගන්තියේ (එහි අතුරු විධානයෙහි කරුණු හැර ) විධිවිධාන නොසලකා හැරීම ; සහ

(iii) එසේ නිශ්චය කරන ලද පිරිවැටුම සම්බන්ධයෙන් ඉහත සඳහන් පනතේ උපලේඛනයේ විෂයාංක 12 හි නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයට අනුව ආර්ථික සේවා ගාස්තු ගණනය කිරීම
කළ හැකි ය. "

යන වචන සහ ඉලක්කම් ඉවත් කොට, ඒ වෙනුවට,

" 03 වන හෝ 04 වන නියෝගයන්හි යම් ඡේදයක සඳහන් යම් වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක නිරත යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් 2007 අප්‍රේල් 01 දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් අදාල කාර්තුවක් සඳහා,

(i) එම වෙළෙඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් එම කාර්තුව සඳහා ලබන පිරිවැටුම එම ඡේදයට අනුකූලව නිශ්චය කිරීම,

(ii) ඉහත සඳහන් පනතේ 2 වගන්තියේ (2) උප වගන්තියේ (එහි අතුරු විධානයෙහි කරුණු හැර ) විධිවිධාන නොසලකා හැරීම ; සහ

(iii) එසේ නිශ්චය කරන ලද පිරිවැටුම සම්බන්ධයෙන් ඉහත සඳහන් පනතේ උප ලේඛනයේ විෂයාංක 12 හි නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයට අනුව ආර්ථික සේවා ගාස්තු ගණනය කිරීම

කළ හැකි ය. "

යන වචන සහ ඉලක්කම් යෙදීමෙන් එකී වගන්ති සංශෝධනය විය යුතුය.

03. ඡේදයේ සඳහන්,

"යම් භාණ්ඩ මෙහෙයුම්කරුයෙකුගේ වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක යම් අදාල කාර්තුවක් සඳහා පනතේ 2 වගන්තියේ (3) උප වගන්තියේ (ආ) ඡේදයට අනුකූලව නිශ්චය කරන ලද පිරිවැටුමෙන්, යම් තැනැත්තෙකු සතු හෝ එම තැනැත්තා විසින් කුලියට ගන්නා ලද යම් නැවකට හෝ ගුවන් යානයකට පටවන ලද යම් නැව් බඩු එම තැනැත්තා විසින් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් එම තැනැත්තාට එම භාණ්ඩ"

යන වචන සහ ඉලක්කම් ඉවත් කොට, ඒ වෙනුවට,

"යම් භාණ්ඩ මෙහෙයුම්කරුයෙකුගේ වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක යම් අදාල කාර්තුවක් සඳහා පනතේ 2 වගන්තියේ (3) උප වගන්තියේ (ආ) ඡේදයට අනුකූලව නිශ්චය කරන ලද පිරිවැටුමෙන්, යම් තැනැත්තෙකු සතු හෝ එම තැනැත්තා විසින් කුලියට ගන්නා ලද යම් නැවකට හෝ ගුවන් යානයකට පටවන ලද යම් නැව් බඩු එම තැනැත්තා විසින් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් එම තැනැත්තාට එම භාණ්ඩ මෙහෙයුම්කරුවා විසින් ගෙවිය යුතු මුදල අඩු කළ යුත්තේය."

යන වචන සහ ඉලක්කම් යෙදීමෙන් එකී වගන්ති සංශෝධනය විය යුතුය.

08 – 78

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.